තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ඉදිරිපිටදීය.

එම්.ඒ.ඩී. ටෙරන්ස් ජෝර්ජ් එ. වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව
RTIC Appeal (පුද්ගලික වශයෙන් විභාග කිරීම)/ 584/2018 (2019.02.18) දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේදී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය.

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචන කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

.

සභාපති: මහින්ද ගම්මම්පිල
කොමිෂන් සභා සමාජික: ජ්‍යෙෂ්ඨ නීතීඥ එස්. ජී. පුංචිහේවා
කොමිෂන් සභා සමාජික: විනිසුරු රෝහිණි වල්ගම

අභියාචක - එම්.ඒ.ඩී. ටෙරන්ස් ජෝර්ජ්
නොනිසි ලත් පාර්ශවය- නම් කළ නිලධාරි, වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

පෙනීසිටීම
අභියාචක - එම්.ඒ.ඩී. ටෙරන්ස් ජෝර්ජ්
එල්.ඩබ්ලිව්.ඒ.එච්.එම්. බණ්ඩාර

පොදු අධිකාරිය - බී.එම්.ජී.ඒ.බාලසූරිය -සහකාර ලේකම්
එච්.එම්.ඩී.කේ.හේරත්- කලමණාකරණ සහකාර

තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය	2018.03.08
තොරතුරු නිලධාරියා තීරණය ලබා දුන් දිනය	ප්‍රතිචාරයක් නොමැත.
නම් කල නිලධාරියා වෙත අභියාචනය යොමු කළ දිනය	2018.04.10
නම් කල නිලධාරියා තීරණය ලබා දුන් දිනය	2018.04.27
තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනය යොමු කළ දිනය	2018.07.03

අභියාචනයට පසුබිම් වූ කරුණු:
අභියාචක විසින් 2018.03.08 දිනැති තොරතුරු ඉල්ලීම මඟින් පහත තොරතුරු ඉල්ලා සිටින ලදි.
1 (A) 2013.11.03 දිනට රා.ක.ස. අධි ශ්‍රේණියේ පුරප්පාඩු කීයක් නිබුනේද ?

(B) එම ආයතන මොනවද?

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ඉදිරිපිටදීය.

(C) එම ආයතන පුරප්පාඩු බව සඳහන් කර එවූ ලිපියේ පිටපතක් ලබා දෙන්න.

2 (A) 2015.01.31 දිනට රා.ක.ස. අධි ශ්‍රේණියේ පුරප්පාඩු කීයක් තිබුනේද ?

(B) එම ආයතන මොනවද?

(C) ඒ සඳහා කී දෙනෙක් බඳවා ගත්තේද?

(D) එහිදී කුසලතා හා සීමිත පදනම් මත කීදෙනා බැගින් බෙදී ගියේද?

(E) පත්වීම් ලබා දුන් ආයතන මොනවද?

(F) පත්වීම් ප්‍රදානය කරන විට එම අයගෙන් කී දෙනෙක් විශ්‍රාම ගොස් සිටියේද?

(G) එම අයගේ නම් මොනවද?

(H) 2016 සැප්තැම්බර් වන විට 2015.01.31 දින (පළමු අදියරේදී) ලබා දුන් පත්වීම් වලින් කී දෙනෙකු විශ්‍රාම ගොස් සිටියේද?

(I) එම අය සේවය කළ ආයතන මොනවාද?

3. (A) 2016 ඔක්තෝබර් මාසය වන විට රා.ක.ස. අධි ශ්‍රේණියේ පුරප්පාඩු කීයක් පැවතියේද ?

(B) එම ආයතන මොනවද

(C) එම ආයතන සඳහන් කර එවූ ලිපියේ පිටපතක් ලබා දෙන්න

(D) 2016.11.10 දිනැ ති ලිපි වලින් (දෙවන අදියරේදී) කී දෙනකුට රාජ්‍ය කළමනාකරණ සහකාර අධි පන්තියේ ලබා දුන්නේද?

(D) එම අය අනුයුක්ත කරන ලද ආයතන මොනවාද?

(E) එම පත්වීම් ලබා දෙන දින වන විට කී දෙනෙකු විශ්‍රාම ගොස් තිබුනේද?

(F) එහිදී කුසලතා සහ සීමිත පදනම් මත පත්වීම් ලබා දුන් සංඛ්‍යාව කොපමණද?

4 (A) පළමු අදියරේ පත්වීම් ලබා දීමේදී සම්මුඛ පරීක්ෂණය සඳහා කී දෙනෙක් සහභාගී වූයේද?

(B) එම අයගේ පැමිණීම අන්සන් කළ ලේඛණයේ පිටපතක් ලබා දෙන්න

(C) දෙවන අදියරේ පත්වීම් ලබා දීමේදී සම්මුඛ පරීක්ෂණය සඳහා කී දෙනෙක් සහභාගී වූයේද?

(D) එම අයගේ පැමිණීම අන්සන් කළ ලේඛණයේ පිටපතක් ලබා දෙන්න

(5) මෙම පත්වීම් ලබා දීමේදී ගරු ආණ්ඩුකාරතුමිගේ අනුමැතිය ලද ලිපි වල පිටපත් හා ඊට අමතරව මෙම පත්වීම් හා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම සම්බන්ධයෙන් විශේෂ අනුමැතිය ලද ලිපි තිබේ නම් ඒවායෙහි පිටපත් ද ලබා දෙන්න.

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ඉදිරිපිටදීය.

තොරතුරු නිලධාරියා පනත ප්‍රකාරව, නියමිත කාලය තුළ පිළිතුරු සැපයීමට අපොහොසත් වූ බැවින් අභියාචක විසින් 2018.04.10 දිනැතිව නම්කළ නිලධරයා වෙත අභියාචනයක් යොමු කරන ලදී. නම්කළ නිලධරයා 2018.04.27 දිනැතිව ප්‍රතිචාර දක්වමින් පවසා සිටියේ දක්වමින් තොරතුරු ලබා දී ඇත. මෙම තීරණයෙන් ද අභියාචක සෑහීමකට පත් නොවූ හෙයින් 2018.07.03 දිනැතිව අභියාචක විසින් කොමිෂන් සභාව වෙත අභියාචනයක් යොමු කරන ලදී.

අභියාචනය සලකා බලන අවස්ථාවේදී උද්ගතවූ කාරණා:

අභියාචක ඉල්ලා ඇති අංක 1-5 දක්වා තොරතුරුවලින් කොටසක් සපයා ඇත. ඉතිරි තොරතුරු තුන්වැනි පාර්ශවයක් විමසා බැලීමෙන් පසු ලබා දෙන ලදී. ලැබුණු තොරතුරු ප්‍රමාණවත් බව අභියාචක පිළිගන්නා ලද හෙයින් ගොනුවේ කටයුතු අවසන් කෙරේ.

නියෝගය:

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 3(1) වගන්තිය ප්‍රකාරව අභියාචක විසින් ඉල්ලුම් කොට ඇති තොරතුරු පොදු අධිකාරිය සතුව පවතින හෙයින්ද, 5(1) වගන්තියේ ව්‍යතිරේකයට යටත් නොවන හෙයින්ද, එම ඉල්ලීමට අදාළ තොරතුරු ලබා දී ඇති බැවින් අභියාචනය අවසන් කරනු ලැබේ.

කොමිෂන් සභා රීතින්හි, රීති අංක 27 (ග්‍රාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) ප්‍රකාරව මෙම නියෝගය දෙපාර්ශවය වෙත සන්නිවේදනය කරනු ලැබේ.